ආසියාවේ පළවන
එකම කතෝලික ළමා පුවත් පත

ක්‍රි. ව. 2014 පෙබරවාරි 17 සඳුදා
06 වෙළුම - 15 කලබ
සතිපතා පත්‍රය - පිටු 16

LP - QD / 36/ News/ 2014

# ළමා ප්‍රදීපය

මිල රු 10/-



## ජය පරාජය දෙකටම අප හුරුකරවන අපේ පාසල්වල

# නිවාසාන්තර ක්‍රීඩා තරඟ

Photos By: ASHEN S. SENARATHNA SLC

Lama Pradeepaya

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.com

# නිවාසාන්තර ක්‍රීඩා තරග ඔබව නායකත්වයට පුහුණු කරනවා.

**ආදරණීය දුවේ පුතේ...**

මේ දින වල පාසල් වල නිවාසාන්තර ක්‍රීඩා උත්සව පැවැත්වෙන කාල වකවානුවක්. කතෝලික පරිසරයක් අති අපේ පාසල් වල දූ දරුවන් මේ දිනවල මහත් උද්‍යෝගයකින් නිවාසාන්තර මලල ක්‍රීඩා උත්සව වලට සූදානම් වෙන ආකාරය අපට පෙනෙනවා. පෞද්ගලික මෙන්ම රජයේ කතෝලික පාසල් වල ප්‍රථම වාරය තුළ ක්‍රීඩා උත්සව පැවැත්වීම තුළින් හොඳ පිරිපුන් ආධ්‍යාත්මයකටත් මනා පුහුණුවක් අපේ දරුවන්ට ලැබෙන බව අමතක කරන්න එපා.

ආදර දුවේ පුතේ, පාසලක නිවාසාන්තර ක්‍රීඩා උත්සව පැවැත්වෙන කොට බොහෝ විට එම අදාළ පාසලේ නිවාස තුනක් නම් කිරීමක් ඔබ දකිනවා නේද? අපේ සාන්තුවරයන්ගේ නම් හෝ නැතිනම් හිටපු රදගුරු තුමන්ලාගේ , පියතුමන්ලාගේ, පැවිදි සොහොයුරියන්ගේ නම් වලින් එම නිවාසය නම් කරලා ඔබට හිතන්නට තවත් මඟක් එතුළින් විවෘත කරලා තිබෙනවා. ඒ තමයි, පාසල් ඉතිහාසය පිළිබඳව, පාසලක් ගොඩ නගන්නට අතීතයේදී අපේ මුතුන් මිත්තන් හෙළපු මහන්සිය හා කැපවීම පිළිබඳව වර්තමානයේ ජීවත් වන අපත් හොඳ ආවර්ජනයක යෙදිය යුතුය.

ආදර දුවේ, පුතේ,කතෝලික පාසලක මනා සංකලනයක් තිබෙනවා. ඉගෙනීම ලැබීම, බාහිර ක්‍රියාකාරකම් , හැකියා, තලෙන්තු දියුණු කර ගැනීමට අත් වැලක්, ආධ්‍යාත්මික පරිචය, යහ දැක්මේ ගුණ වගාව, යහපත් ආකල්ප වර්ධනය, වටිනාකම් වැඩි දියුණු කිරීම, මේ සියල්ලම පාසලක් තුළ දරුවන් හට කා වැද්දීමට හා ලබා දීමට හැම කෙනෙක්ම කැප වන්නේ එකී පරිසරයන් ඒ හා සමගම සමතුලිත කිරීමෙන්. ඒ අනුව පාසලක මුල් වාරය තුළදී නිවාසාන්තර මලල ක්‍රීඩා පැවැත්වීම අතීශයින්ම වැදගත් වෙනවා.

ආදර දුවේ පුතේ,

තරගයක් පවත්වන විට ජය පරාජය අපි එකසේ ලැබිය යුතුයි. තමන් ඉන්නා පරිසරයේ තමන් දන්නා අය සමඟම සුහදව නමුත් තරගකාරී ස්වරූප යකින් තරග වලට ඉදිරිපත් වීමෙන් මේ පවසන වටිනාකම වැඩි දියුණු කර කරන්නට අපට හැකිවෙනවා. ජය ලැබීම තුළ අපි අත් දකින්නේ ජයග්‍රහණයේ සතුටක්. නිවාස අතර තරගයකදී ජය ලබන නිවාසය ඔල්වරසන් දී ජයග්‍රහණය භුක්ති විඳින කොට තවත් නිවාස යක් පැරදී යම් සංතාපයකට පත්වී සිටින්නට පුළුවන්. නමුත් මේ ජයග්‍රහණය හා පරාජය විඳීම තුළින් ජීවිතයේ ගැඹුරු ආධ්‍යාත්මික පන්නරයක් ලබන්නට දරුවන් ලබන වටිනා පුහුණුව හා අත් විඳීම ගැන ඇත්තෙන්ම සතුටු වන්න ඕනෑ. එකිනෙකාගේ හැකියාවන්, දක්ෂතාවයන්, අඩුපාඩුකම්, අතපසුවීම්, දුර්වලතා, පැහැදිලිව හඳුනා ගන්නට මෙවන් අන්තර් නිවාස තරග ඉමහත් සේ ඉවහල් වෙනවා.

ජය , පරාජය විඳීමේදී එකිනෙකා ඇගැයීම තුළින් එකිනෙකාව පිළිගන්නටත් හොඳ ඇතුලාන්ත ආධ්‍යාත් මික පරිචයක් දරුවන් හට ලැබෙනවා. ඒ වගේම ඉදිරි අනාගතය කෙබඳු විය යුතුද යන්න සහජ දක්ෂතා ඉදිරියේ තමන් ගැනම තමන්ට හොඳ තක්සේරුවක් කිරීමට මෙවැනි අන්තර් නිවාස තරග මහෝපකාරී වෙනවා.

ඉතින් ආදර දුවේ, පුතේ, පාසල් වල තිබෙන මේ විනයගරුක තරග වලින් ඔබ ලබන පන්නරය ගැන ඔබත් හොඳට කල්පනා කළොත් ඒ පිටිවහල ඔබට කෙතරම් දුරට ධනාත්මකව බලපා ඇත්දැයි කිරා මැන බලන්නට ඔබටම අවස්ථාවක් සැලසෙනවා නේද?, මෙවර ළමා ප්‍රදීපය වෙන් වන්නේ අන්න ඒ සත් කාර්යයට ඔබව යොමු කරවන්නයි. ඉදිරි අනාගතයේදී ඔබේ පෞරුෂය ගොඩ නගන්නට පාසලේ මේ බාහිර ක්‍රියාකාරකම් දැඩිව බලපාන නිසා මේවා අතපසු කර පසුව පසුතැවිලි වන්න එපා.

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා



# කොයි කිතුනු සභාවත් හරිද?

එහෙත් සංශෝධනයක් කළ යුත්තේ , මුල් සභාවෙන් බෙදී යාමෙන් නොවේ. දහසය වන සිය වසේදී දියත් වූ රෙපරමාදු සංශෝධන ප්‍රයත්නයෙන් වුයේ කිතුනු සභාව තව තවත් බෙදීම ය, තව තවත් ව්‍යාකූලත්වයට පැමිණීම ය. කිතුනු සභාවේ දුර්වලතාවන් හා දූෂණයන් සුව කිරීමට ඒ සභාවෙන් වෙන් වී යාම බඩේ අමාරුවක් නිසා අත් පා කපා දැමීම හා සමාන ය.

ආරම්භයේ සිටම කිතුනු සබාව විසින් සංශෝධනය සඳහා ක්‍රියා කර ඇති බව සභා ඉතිහාසයෙන් පෙනේ. අපෝස්තුලුවරුන්ගේ කාලයේ පටන් මේ සිය වසේ වූ දෙවන වතිකාන සමුළුව දක්වා කතෝලික සභාව විසින් කලින් කලට ජගත් මන්ත්‍රණ සභා පවත්වා ඇත්තේ, ඒ ඒ කාලයට වුවමනා වූ සංශෝධනයත් සභාවේ ප්‍රගතියත් ගැන සලකා බලා නිසි පියවර ගැනීමට ය.

### 5. මූල ධර්ම වාදය නිසා බෙදුම්

මෙතෙක් අප විමසා බැලුවේ, කිතුනු සභාව බෙදී යාමට හේතුය. එහෙත් විසි වන සිය වසට විශේෂ වූ අනික් අමුතු ව්‍යාපාරයකි. ඒ කිතු සසුන බෙදීමට පමණක් නොව, එය කොන් කිරීමට ද තනනන ව්‍යාපාරයකි. එය කිතුනු මූල ධර්ම ව්‍යාපාරය වශයෙන් හැඳින්වේ. එය ආරම්භ වුයේ අමෙරිකාවේ ය. 1909 දී ''මූලධර්ම'' යන නම ඇති, කාණ්ඩ දොළසකින් යුත් විශාල ග්‍රන්ථයක් එරට පළ කරනු ලැබී ය. ඒ ග්‍රන්ථය, මූල ධර්ම ව්‍යාපාරයට බලවත් රුකුලක් විය.

කලින් කලට අමෙරිකාවේ ම මූල ධර්ම වාදී නිකාය කීපයක් ජනිත විය. ඒවා ලෝකයේ නොයෙක් රටවල ධර්මප්‍රචාරයෙහි යෙදී ඇත. ඇසෙම්බ්ලි ඔෆ් ගෝඩ්, කල්වාරිය, සෙවන්ත් ඩේ ඇඩ්වෙන්ටිස්ට් වැනි නිකායයෝ මෙරට ද තමන්ගේ ධර්මයන් ප්‍රචාරය කිරීමෙහි උද්‍යෝගිමත් ව යෙදී සිටිත්.

මේ ව්‍යාපාරයේ පුරෝගාමීන් විසින් මුලින් ම පිළිගන්නා ලද කිතුනු මූල ධර්ම පහක් විය. එනම් :

1. බයිබලය දේවානුභාවයෙන් ලියා ඇති බවත් එය නොවරදින සුලු බවත්.
2. ක්‍රිස්තුන් වහන්සේ කන්‍යාවකගෙන් උපන් බවත් උන් වහන්සේට දේව බව තිබුණු බවත්,
3. උන් වහන්සේ මනුෂ්‍යයන්ගේ පාපවලට වන්දි ගෙවනු සඳහා දිවි පිදු බව.
4. උන් වහන්සේ ඇත්ත වශයෙන් උත්ථාන වූ බව.
5. උන් වහන්සේ යළි වඩින බව.

පසු කලෙක , මූල ධර්ම සම්බන්ධයෙන් ඒ ඒ නිකායන් අතර භේද හට ගැනුණත්, මූල දී මේ පස මූලධර්මවාදයේ පදනම විය.

මේ මූල ධර්ම පිරික්සා බැලූ විට අපට පෙනී යන්නේ ක්‍රිස්තුන් වහන්සේ වෙත භක්තියත් බයිබලයට අග තැනක් දීමත් මූල ධර්ම වාදයේ විශේෂාංග බව ය. ඒ සමග , තවත්, කැපී පෙනෙන කරුණක් හෙළි වේ. එනම් මූල ධර්ම වාදය ක්‍රිස්තුන් වහන්සේගේ සභාව කොන් කිරීමය, ඊට තැනක් නොදීමය. මූල ධර්ම අතර ඒ සභාව ගැන වචනයක් වත් නැත.

### 2. කොයි කිතුනු සභාවත් හරි විය හැකි ද?

මුල් කිතුනු සභාව කලින් කලට බෙදී ගොස් දැන් සභා රැසක් ඇත. එක් එක් සභාව එය ක්‍රිස්තුන් වහන්සේගේ සත්‍ය සභාව ය යි කියනු විය හැකි ය. එහෙත් ඒ කොයි සභාවත් සත්‍ය විය හැකි ද? එය කිසි සේත් නො විය හැක්කකි. ඊට හේතුව ඒ ඒ සභා පරස්පරවිරෝධි ධර්මයන් ඉගැන්වීම ය.

යම් කිතුනු සභාවකට අයත් සභිකයින්ගේ සදචාරාත්මක හැසිරීම ද වන්දනා ක්‍රම ද ඒ සභාවේ ධර්මයෙන් හැඩ ගැසේ. එබැවින් කොයි කිතුනු සභාවේත් පදනම ධර්මය යි. ඒ ධර්මය එන්නේ ක්‍රිස්තුන් වහන්සේ ඉගැන්වීමෙනි. කිතු සසුනේ දහම් ගුරුවරයා හෙවත් ශාස්තෘවරයා උන් වහන්සේ ය.

උන් වහන්සේගෙන් නික්මුණු ධර්මය භේද වුවක් විය නොහැකි යි. එහෙත් කිතුනු සභාව බෙදී යාමෙන් වී ඇත්තේ උන් වහන්සේගේ ධර්මය ද බෙදීම ය. උන්වහන්සේ මිනිසාට ඉගැන්වීමට අදහස් කෙළේ අවිනිශ්චිත වුත් භේද වුත් ධර්මයක් ද? කොහෙත් ම නැත. එහෙත් ඒ ඒ සභා පරස්පර විරෝධි ධර්මයන් ඉගැන්වීමෙන්, ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි ද භේදයක් ඇති බවක් අප විසින් පෙන්වනු ලබයි. එය උන් වහන්සේට නිගාවකි. ඇත්ත වශයෙන් උන්වහන්සේගේ ධර්මය අවුල් බවට පත් කර ඇත්තේ මිනිසා ය. කිතුනු සභා එකිනෙකට විරුද්ධ ධර්මයන් උගන්වන බැවින් කොයි සභාවත් හරි ය කියන්නට බැරි ය. මතු එන්නේ ඊට නිදසුන් කීපයකි.

**ඩබ්ලිව්. එල්. ඒ. දොන් පීටර් පියතුමන්ගේ ග්‍රන්ථයක් ඇසුරිණි.**

**ඉදිරියට .......**

# උපන් දින තෑග්ග

**එද සමන්තගේ තාත්තගේ උපන් දිනයයි. ඔහුගේ අම්මා විසින් තම පියාට කඩෙන් ලස්සන කොටු වැටිච්ච කමිසයක් උපන් දිනයට සුභ පතා ඔහුට දුන්නාය. සමන්තගෙ අක්කා තමන් විසින්ම දින ගණනක් තිස්සේ ලස්සනට මහපු කොට්ට උරයක් තාත්තාට පිළිගැන්වූයේ ඔහුව බදාගෙන "සුභ උපන් දිනයක් තාත්තේ" කියා පතමින්ය. කුඩා සමන්තට දීමට කිසිවක් අත නොතිබුණි. ඔහු තාත්තාට නිකම්ම උපන්දිනයට සුභ පතා නික්ම ගියේය.**



මද වේලාවකින් සමන්තව මුණ ගැසුණු අම්මා, ''පුතේ ඔයා දැක්කානේද අක්කා දුන්න කොට්ට උරේ දැකලා තාත්තා කොච්චර සන්තෝෂයකින් ඒක බාරගත්තාද කියලා? ඔයාටත් තිබුණනෙ අඩුම ගානේ උපන් දින කාඩ් එකක්වත් ලස්සනට ඇඳලා පාට කරලා තාත්තට දෙන්න'' කුඩා සමන්ත පිළිතුරු දෙමින් ''මම නම් ඔය වගේ පොඩි පොඩි තෑගි දෙන්නෙ නෑ. දෙනවා නම් දෙන්නේ තාත්තගෙ හිතට සතුට වගේම ආයේ කවදාවත් තාත්තට අමතක නොවන දෙයක්.'' ''අප්පෝ මෙයාගේ පණ්ඩිත කතා හොඳයි අපි බලමුකෝ මෙයා ලබන අවුරුද්දෙ තාත්තට දෙන ඒ අමරණීය තෑග්ග මොකද්ද කියලා.'' අක්කා මල්ලීට ඔලොක්කුවක් දමමින් කීවාය. ''ලබන අවුරුද්දෙ නෙවෙයි මේ අදම ඒ දෙනවා.'' කියා ඔහු උජාරුවෙන් කීවේය.

එවිටම ඔහුගේ යාළුවෝ කීප දෙනෙක් ගෙපිළට පැමිණ සෙල්ලම් කිරීමට කතා කළෝය. ''හා දැන් ඉතිං යාළුවොත් එක්ක සෙල්ලමට ගියහම රෑවෙලා තමයි ආයෙ එන්නෙ. අද නෙමෙයි මේ අවුරුද්දටම තාත්තට ඔය කියන තෑග්ග නම් හම්බුවෙන එකක් නෑ'' අක්කා ආයෙත් මල්ලිට සවුත්තුව දැම්මා. සමන්ත යාළුවො ඉදිරියේ මුකුත් නොකියා ඔවුන් සමඟ පිටත්වුනා. සමන්ත එද වෙනදටත් කලින් ගෙදර ආවා.

ඔහුගේ අතේ හිල් විදපු කඩදසි මල්ලකුත් තිබුණා. ඔහු තාත්තා ලඟට ගොස් ඔහු බදාගෙන ''තාත්තේ මෙන්න මගෙනුත් තාත්තට උපන්දින තෑග්ගක්'' කියා මල්ලි ඔහු අත තැබීය ''මොනවද පුතේ මේ? '' ''ඔකෙ ඇතුලේ ඉන්නේ වී කුරුළු ජෝඩුවක් මං අර කඩෙන් ගත්තෙ'' ''කොහෙන්ද පුතාට සල්ලි'' ''මගේ කැටෙන් සල්ලි ගත්තා තාත්තා ඔය කුරුළු ජෝඩුව අරගෙන වත්ත පහළට ගිහින් උන් නිදහස් කරන්නකො එතකොට තාත්තට උන් නිදහසේ ඉගිල්ලිලා යනවා දැකලා සතුටු වෙන්නත් පුළුවන් ඒ වගේම තාත්තට ගොඩක් පින් ලැබෙනවා'' පුතාගේ කීමට තාත්තා උන් නිදහසේ අහසේ පියාසර කරන ආකාරය බලාසිට පුතාව වැළඳගෙන ''සත්තකින්ම පුතේ මට හරිම සන්තෝෂයි පුතා මේ කුඩු කරලා ඉන්න සතුන්ට දක්වපු කරුණාව ගැන ''කියා සමන්තව සිපගත්තේය.




**සිරිල් පෙරේරා මාමා**

# ළමා ප්‍රදීපයේ පළවූ ස්වරාජ්‍යපුරය ලිපිය අගෙයි !

**පෙරදිග මුතු ඇටය ලෙසින් හැඳින්වූ ශ්‍රී ලංකාවෙ 66 වසර නිදහස සමරන දින ළමා ප්‍රදීපය පුවත් පතේ නිදහස් සටනට දායක වූ හලාවත පදවියේ පිහිටි "ස්වරාජ්‍ය පුරය" නම් විශේෂ ලිපිය කියවා බලා මෙම සටහන ලිවීමට සිත් යොමුවිය.**

පළමුව ගම ගැන සුන්දරත්වය හා ගමන් මාර්ගය පෙන්වාදී තිබුනි. නිදහස් සටනේ දායකත්වය ලබා දුන් කිතුනු අයගේ නාමාවලිය හා පිංතූරු පළකර තිබීමත් අගය කළ යුතුය.

විශේෂයෙන් මහත් මා ගාන්ධි තුමා මෙම පුරවරයට පියවර තැබීමෙන් එදා සිටි කිතුනු ගම් වාසීන් හා මෙකී උත්සවයට මුල් තැන ගෙන කටයුතු කළ ගරු පියවරුන් ලොකු සතුටක් අත් දකින්නට ඇති.

ලංකා ජාතික සංගමයේ 23 වන සැසිවාරය පැවත්වූ බව හෙළිදරව් කර ඇත. මේ සුවිශේෂී වූ අවස්ථාවට




අති උතුම් එඩ්මන්ඩ් පීරිස් රාජගුරු ප්‍රසාදින් වහන්සේ ද සහභාගී වීම විශේෂත්වයක් බවත් සිහිපත්කර ඇත. මෙය බොහෝ කිතුනු අප නොදත් විශේෂ දෙයකි. නිදහස් සටනේ දයකත්වය අගයමින් "ස්වරාජ්‍ය පුරය " පිළිබඳ විස්තරයක් කිතුනු ළමුන් වෙනුවෙන් ළමා ප්‍රදීපයෙහි පළකළ සහය සංස්කාරක කුමර නයනජිත් මහතාට පාඨක ලේඛක සැමගේ ප්‍රසාදය මෙයින් පුදමු.

**ආර්. ජෝශප් ප්‍රිය**

# පන්නිපිටිය මීසමේ දක්ෂ ලේඛකයෝ

## ජේසු අම්මේ



අඳුරු දිවියට ආලෝකය මෙන්
වැටී වුන්නු මා හට ඔබ සවියකි.....
ඉල්ලු සැම නිති නුදුන්නෙ ඇයි දැයි
අද තේරෙයි මෑණියනි මගේ ......
අහිමි වූ සෙනෙහස
දී මවකගේ පෙම රක්ෂා කලේ ඔබ
මටද හොරෙන්
තුති පැසසුම් මදිය ගයන්නට
මව්නි ඔබේ ගුණ කඳ උදෙසා
දිවියේ ඉදිරිය දැන්මට බිය නැත
ඔබ මා අතගෙන සිටින නිසා

**රසිකා ජයරත්න**
**12 ශ්‍රේණිය**
**ක්‍රිස්තුරාජ දේවස්ථානය - පන්නිපිටිය මීසම**

## තාත්තාගේ මතකය



තනිව සොහොනකට වී
සන්සුන්ව ඔබ හිඳී
අරලියා එක දෙක වැටී,
නුඹ දෙපා හැඩ කරාවි
පහන් සිළු ටික ටික නිවී
අවර ගිරෙන් බැස යන මළ හිරුගේ
අඳුර අතරින් ඇසෙයි රැහැයි ගීතය
එය නුඹේ පාළුව මකාවි
තාත්තා යළි එන්නැතී
එන්න මඟකුත් නම් නැතී
තිබූ ආදරෙ අඩු නැතී
මතකයි නුඹ සොඳුරැතී

**මෙෂානි තිළිණි**
**12 ශ්‍රේණිය - ශු. මිකායෙල් දේවස්ථානය - හෝමාගම**

**වැඩමුළුවක ප්‍රතිඵලයක්**

## දිවියෙන් දිවියට

කුණාටු සාගරයේ හබල බිඳුණු නෞකාවේ හබලක් වූ,
මා දිවිය වෙනුවෙන් තම දිවියම කුණාටුවට හසුකළ,
දොළොස්මහේ පහනක් සේ මගේ දිවිය පහන් කළා, කිසිදා
ගෙවිය නොහැකි ණයක් ලෙස සින්නක්කර වූ, ඔබේ අපරිමිත
සෙනෙහසින් දස මසක් කුස තුළ රැඳුණු, නිවැරදි මග වෙත
කැඳවා මා දිවියට අරුතක් එක්කළ, වෙම් ඔබට අසිරියක්
මගේ දිවියෙන් මා ......

**තරුෂි නෙළුම් කුමාරි - 11 ශ්‍රේණිය**
**සා. සෙබස්තියන් දහම් පාසල**
**රුක්මල්ගම (පන්නිපිටිය මීසම)**

## මව් සෙනෙහස



දස මසක් මා කුස හොවා
ලේ කිරි කර මට පොවා
හැම දුක් කඳුළු විඳ දරා
ඔබ මා ඇති දැඩි කළා

හැම ඉරිදාවකම
පල්ලිය වෙත මා යැවුවේ
ජේසුගේ ආදරය මට පෙන්වා දුන්නේ
මා ආදර මෑණියනේ ඔබමයි

**සුරනි අමාෂා මෙන්ඩිස්**
**11 ශ්‍රේණිය**
**ලූර්දු දේවමාතා දේවස්ථානය - දික්හැතැක්ම**

## මාසික සිතිවිල්ල

**මාසික සිතිවිල්ල**

"පෙබරවාරි මාසය"
ළමා ප්‍රදීපය,
අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.



## ඔබේ සමිතිය ගැන අපිට ලියා එවන්න.




**ඔබ පාසලේ, දහම් පාසලේ ඇති ළමා සමිති සමාගම් පිළිබඳව තොරතුරු පළ කිරීම සඳහා එම සමිතියේ තොරතුරු, නිලධාරි මඬුල්ලේ නම් ගම් ද ඇතුළත් කොට සමූහ ඡායාරූපවක් සමඟින් විස්තර**

**"අපේ සමිතිය", ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08. යන ලිපිනයෙන් අප වෙත යොමු කරන්න.**

ගොඩැල්ල මීසමේ දංකොටුව උත්ථාන වූ කිතු සමිඳුන්ගේ දෙව්මැදුරට අයත් දරුවන් 16 දෙනෙකුට ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දනය කිරීම පසුගියද ගොඩැල්ල මීසම් සේවක ගරු මොරිස් ඇන්ඩර්සන් හිටපු මීසම් සහයක ගරු ධනුෂ්ක ප්‍රනාන්දු පියතුමන්ලා අතින් සිදුවිය. අනතුරුව එම දරුවන් ගරු පියතුමන්ලා සහ දහම් උපදේශිකාවන් සමග ළමා ප්‍රදීපය සඳහා ඡායාරූපයකට පෙනී සිටි අයුරු මෙහි දිස්වේ.



**ඇන්ටන් ජෙරාඩ් ප්‍රනාන්දු**



**බෝලවත්ත මීසමට අයත් කම්මල ශාන්ත ඔඩිලියා දේවස්ථානයේදී ළමෝ 30 ක් ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබුහ. හිටපු මීසම් සේවක ගරු ලක්සිරි ප්‍රනාන්දු පියතුමා දහම් ගුරු උපදේශිකාව ඇතුළු ළමුන් දිව්‍ය පූජාවෙන් පසු සමූහ ඡායා රූපයකට පෙනී සිටි අයුරු.**

**මාලනි බර්ණදෙත්**

---

කොළඹ ශාන්ත බෙනඩික් විදුහලේ වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා උළෙල පසුගියදා සුගතදාස ක්‍රීඩාංගනයේ දී පැවැත්වුණි, මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ.

**අශේන් එස්. සේනාරත්න**






පමුණුගම බෝපිටිය ලොයෙලා විද්‍යාලයේ නිවාසාන්තර ක්‍රීඩා උත්සවය විදුහල්පති ගරු ජුඩ් අසන්ත පෙරේරා පියතුමන්ගේ සංවිධානයෙන් දකුණු කොළඹ කලාපිය නාහිමි අතිගරු ඇන්තනි ප්‍රනාන්දු පුල්ලේ පියතුමාගේ ප්‍රධානත්වයෙන් බෝපිටිය ලියෝ ක්‍රීඩාංගන යේදී පැවැත්වුණි මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ.

**බෙන්ජමින් කිරිහෙට්ටි**



# නිර්මලීගේ ලොකු පුතා






"නිමා ..... නිමා ..... නිමා , කෝ ඔයා කොහේද? කොන්සි අක්කාගේ කලබලකාරී හඬින් තිගැස්සී ගිය නිර්මලී සෝදු අහවර නොකළ රෙදි එතැනම දමා දිව ආවාය. "ඇ.. ඇයි කොන්සි අක්කේ කලබලේ" ඔයා දන්නවනේ ගමේ පෝර ගබඩාව ගැන දැන් ඒකේ විෂ රසායනික ද්‍රව්‍ය එන්න එන්නම පරිසරයට බලපානවලු. ඉතින් දැන් ගමේ මිනිස්සු එකතු වෙලා කියන්න ඕන හැම තැනකටම කීවානේ. ඒත් වැඩක් නැහැ. එදා අපි කරපු උද්ඝෝෂණයට මන්ත්‍රී තුමා කියපු දේවල් තවම ඉටු වුනේ නැහැ. ඒ දරුවෝ දෙන්නා තුන්දෙනා වතුර නිසා හමේ විෂ රෝග හැදිලා තවමත් රෝහලේ. මහතුන් අයියගේ දරුවටත් ඊයේ හුස්ම ගන්න බැරි ලෙඩක්ලු මේ සේරම ප්‍රශ්න මේ පෝර ගබඩාව හින්දනේ. දැන් ඔයා රෙදි හෝදන්නේ අම්මගේ ගෙදරින් ගෙනාපු වතුරින්ද නිර්මලා"? අනේ ඔව් මමයි පුතයි හැමදම හවසට වතුර බැරල් දෙකක් අරගෙන එනවා ගිහිල්ලා "මේ මොන කරදරයක්ද වතුර කටේ තියන්න බැහැ ඇඟ හෝදන්නත් බැහැ.

ඒක තමයි නිර්මලා අද ගමේ මිනිස්සු එකතුවෙලා උද්ඝෝෂණයක් ආයෙත් කරන්න යනවා. ඔයත් එන්න. මහතුන් කිව්වා හැමෝටම කියන්න කියලා. නිර්මලීට කිසිවක් උත්තර දීමට බැරි සේය. ඇයට හැම දෙයක්ම එකවර මැවී පෙනෙන්නට විය. ලොකු පුතා ඉස්කෝලේ ගිහිං එනකොට බත් ටික උයා තියන්ට ඕනේ. උදේටත් හරියට කෑමක් කන්ට තිබුනේ නැහැ. පරණ බනිස් ගෙඩියක් රත්කරලා කෑවේ. පුතා කවදාවත් කෑම ගැන හොයන්නේ නෑ. ඇඳුම් ගැනත් එහෙමයි. නිර්මලීට පපුව රිදෙනවා වගේ දැනුණා. බස් එකෙන් බහින කොට එහා පැත්තෙන් ආපු කාර් එකට හැප්පිලා ඇන්ටනි මැරුනේ හදිසියේම. එදා ඉඳං ලොකු පුතාව පාසල් යවන්න නිර්මලී සෑහෙන උත්සහයක් ගත්තා. පුතා ඉගෙන ගන්නත් හරි දක්ෂයා. පන්තියේ ගුරුවරු ඔහුට හරි ආදරෙයි. අම්මා විඳින දුක බලාගෙන ඉඳලා දවසක් ඔහු කිව්වා "මම කොහොම හරි විශ්ව විද්‍යාලයට යනවා. අම්මා මං ලොකු රස්සාවක් හොයාගෙන සල්ලි ගොඩක් ගේනවා. එතකොට අම්මට දුක් විඳින්න ඕනේ නෑ. මං ලස්සණ ගෙයක් හදනවා. තාත්තගේ පිංතූරේ ලොකු කරලා ඉස්සරහින්ම තියමු." ලොකු පුතාගේ හිතේ තිබෙන බලාපොරොත්තු ඉටුවෙයිද? සවසට ශ්‍රී හෘදයේ සුරුවම ලඟ පහන් දල්වලා ඇන්ටනීවත් සිහි කරන නිර්මලී කඳුළු පිරි දෙනෙතින් ලොකු පුතාගේ හිස අතගානවා.

"කොන්සි අක්කේ" අද නම් මට උද්ඝෝෂණ රැලියට එන්න විදියක් නෑ. අම්මා සනීප නැහැ. එයාවත් බලලා පුතාට උයලා , වතුර බෝතල් 3 ක් වත් අරගෙන එන්නට ඕනේ හෙට බොන්නවත් වතුර නෑ. මං හෙට නොවරදම එන්නම් කියන්න මහතුන්ට. මං හැමදේම තනියම කරගන්න එපැයි, ඇන්ටනී හිටියා නං, ඔය වගේ දේවල්වලට මූලිකයා වෙලා කථා කරයි". "කමක් නැහැ නිමා, ඔයාටත් හැමදේම තනිවම කරන්ට ඕනේ නේද? එහෙනම් ඔයා හෙට එන්නකෝ මං යන්නම්. නිර්මලා නැවත රෙදි සෝදනවා. උයන්න සූදනම් වෙනවා. මොන කරදරයක්ද මේ, වතුර ටික විෂ වුන හින්දු අපට එක එක හිරිහැර නිර්මලා තනිවම හීල්ලුවා.

සවස ටියුෂන් පංතියටත් ගිය ජනක ලොකු පුතා ගෙදර ආවා අම්මා ආච්චිලගේ ගෙදර යන්ට ඇති, ඔහු හිතුවා කෑම ටික කාලා හාන්සි වුණා. වතුර බෝතල් 2 ක් පාසලේ ඉඳලාම උස්සගෙන ඇවිත් අතත් රිදෙනවා. "ජනක පුතේ " එහා ගෙදර නැන්දගේ හඬ. ඇයි නැන්දෙ, අම්මා කෝ ! තවම ආවේ නැහැ ආච්චිගේ ගෙදර යන්න ඇති." ඒ සමගම විශාල වෙඩි ශබ්දයක් ඇසෙන්නට වුනා කෑ ගැසීම් , විලාප, කලබලයක්,ජනකට බියක් දැනුනා. පාරේ තිබුන උද්ඝෝෂණ රැලියට හමුදාව ආයුධත් අරගෙන ඉන්න හැටි මතක් වුනා. එකවරම අම්මාව සිහිවූ ජනක ලොකු පුතා පාරට දිව්වා. මිනිස්සු සී සී කඩ දුව එනවා. හමුදාවෙන් පහර දීම් වෙඩි, ශබ්ද දිගටම , පල්ලියට දුවපල්ලා, පාරට යන්ට එපා. පල්ලිය වත්තේ එක රොත්තට මිනිස්සු අම්මා මේ අතර ඇති. "අම්මා, අම්මා ජනක කෑ ගැසුවා. පල්ලිය ඇතුලට ගිහිං පිස්සෙක් වගේ කෑගැසුවා. එතකොටම කොහෙන්දෝ ආපු වෙඩි වරුසාවකට ජනක මැදිවුනා. කීප දෙනෙක් තුවාල වුනා. ජනක ඇදගෙනම වැටුනා. නිර්මලා වතුර බෝතල් පැත්තකට දලා පල්ලිය දෙසට දුවගෙන ආවා. කව්ද ළමයෙක් මැරිලා මිනිස්සු කෑ ගහනවා. නිර්මලාත් එතැනට දිව්වා. ආනේ දෙයියනේ මේ මගේ පුතා නේද? අනේ මගේ ලොකු පුතේ, "නිර්මලාට සිහිය නැහැ. කීප දෙනෙක් ඇය උස්සාගෙන ගොස් සාත්තු කළා. දැන් වෙඩි තියපු අය කව්රුවත් නැහැ. නැවත නැවත සිහිය එන නිර්මලා ඇදගෙන වැටෙනවා. පියතුමා ඇවිත් ඇයව උස්වසන්න උත්සාහ කළා. ඇය වැටී සිටියේ හරියටම වික්ෂෝප අම්මගේ සුරුවම ලඟ කව්ද මගේ පුතාට වෙඩි තිබ්බේ. ඇයි මගේ ලොකු පුතාව මැරුවේ" පල්ලිය තුළ දෝංකාර දෙනවා. නිර්මලා වාගේම නිර්මල මෑණියෝ තම මළගිය පුතාව උකුලේ හොවාගෙන නිහඬවම ලෝකයාගෙන් අහනවා. ඇයි මගේ ලොකු පුතාව මැරුවේ කව්ද මගේ ලොකු පුතාව මැරුවේ" කව්ද එදා නිර්මල දේව අම්මා කොච්චර හඬා වැටෙන්න ඇද්ද? අද කාලේ මේ විදියට අසාධාරණ මිනිමැරුම් ඉදිරියේ අඬා වැටෙන නිර්මලාටද ලොකු පුතාව සදහටම නැතුව ගියා.

සෙලීන් ෆොන්සේකා නැන්ද - බෙල්ලන්විල

# මරිය වසර

ලොව සැම තැන රජ කරවන
නපුරාගේ රුදු බලයෙන
මා මෙන් සැම දරුවන් රකින්න
මවේ ඔබේ සළු සෙවනට අරගෙන

මරිය වසර උදවුණා
ජපමාල අත රැඳුනා
රෝබිය අනතුරු වලිනා
මරිමව අප රැකගන්නා



**ජේශිකා ඈන් දෙව්දුණි ප්‍රනාන්දු**
**06 ශ්‍රේණිය**
**සා. මයිකල් දහම් පාසල - කොරළවැල්ල**

# කුරුළු ගීත

කුරුළු පැටව්ගේ ගී අසනා
සැමගේම සිත් පුබුදිනා
මුළු වනයම සෑම දිනක
නව දවසකි සැම දෙන හට
කුරුළු පැටව් හරි සුරතල්
කිසි දිනෙකත් නෑ සරුවල්
හැම කෙනෙකුම හැම දිනකම
මේ දෙන්නගේ ගී අසයි
සැම දෙනාම සවන් දෙන්න
අත් පොළොසන් හඬ නඟන්න



**නිරුමා ප්‍රනාන්දු**
**08 ශ්‍රේණිය**
**සා. ජෝශප් විදුහල - මීගමුව ශාඛාව**




# ආදර තාත්තා



දහඩිය දුක් කඳුළු හෙලා
මුළු දවසම වැඩ කරලා
අප ජීවත් කරවන්නට
වෙහෙස වෙන්නෙ මගෙ තාත්තා

රස ආහාර මට කවලා
මා වෙනුවෙන් වෙහෙසීලා
අපට අකුරු උගන්වන්න
වෙහෙස වෙන්නෙ මගෙ තාත්තා

ආදර දෙවි පියාණෙනී
නිති සැනසුම ලබා දෙන්න
සැම නපුරෙන් රැක දේවා
මගෙ ආ...දර  තාත්තා

**පියුමි හර්ෂණි**
**08 ශ්‍රේණිය - දංකොටුව බාලිකා මහ විදුහල**

# හොඳම යාළුවා



ජේසු තමයි අපේ හොඳම මිත්‍රයා
අපට අවශ්‍ය හැම මොහොතෙම
අප ළඟ සිටියා
දේව වචනයේ සඳහන් ලෙසින්
අප එය පිළි පැදීම තුළින්
අප ජීවිත අර්ථවත් වුනා

**නවෝද්‍යා සත්සරණි**
**07 ශ්‍රේණිය**
**ශා. ඉසිදොරු දහම් පාසල**
**තිබ්බටුගොඩ**

# පුංචි ඔවදනක්



හමන සිසිල් සුළඟත් සමග කුරුල්ලන්ගේ කිචි බිචි නාදයන් සමග මල් සුවඳින් මා අවදිවිය. මට දැනුනේ අද දවස ඉතා ලස්සන දවසක් කියලයි. ඊත් එක්කම  මාගේ ආදර දෙවි පියාණන්ට අද දවස ලබා දුන්නාට ස්තූති කියමින් මම මාගේ දවසේ වැඩ කටයුතු ආරම්භ කළෙමි. දෙවි පියාණන් මා සමඟ ගෙවෙන සැම මොහොතකම සිටි. අපේ ආදර දෙවි පියාණන්ට මේ ලෝකයේ කළ නොහැකි දෙයක් නොමැත. අපි අපේ දෙවිපියාණන්ට සෑම මොහොතකම අවදියෙන් සිටි නම් අප ජීවිතයේ සෑම දේටම දෙවියන්වහන්සේ අපට ආශිර්වාද කරයි. ඉතිං නංගියේ මල්ලියේ ඔබ සැමත් එකම විශ්වාසයකින්   දෙවි පියාණන්ට යාච්ඤා කරන්න. අවදියෙන් ඉන්න. එවිට මට මෙන්ම ඔබටත් දෙවි පියාණන් සමඟ සතුටින් සිටිය හැකිය.

**මධුභාෂිණී කෞශල්‍යා**
**08 ශ්‍රේණිය  - ශු. පවුලේ දේවස්ථානය - බිබිල**

# ස්වර්ගයේ නිර්මල වූ ලිලී කුසුමෙනී

රුවින් , ගුණෙන්, වදනෙන් හුදු ලියන් පැරදවු
නිහඬ බවින් සමිඳු වෙතට තම හද නැංවු
ලොවැසි සැමට දෙවි දකින්න පෙරමඟ සැලසු
නිමල කන්‍ය මෑණියනි ඔබ අප මව වූ

ආදරයෙන් අප වෙනුවෙන් මැදිහත් වන්නි
සියළු පවින් වැලකෙන්නට ආසිරි ලද්දි
ස්වර්ගයේ නිර්මල වූ ලිලි කුසුමෙනි
පිහිට වරම් පතනෙමි අප ඔබෙන්
මරියනී



**හිරුණී රංසිකා සහ ප්‍රසාධි**
**ඉරෝෂණි**
**08 ශ්‍රේණිය**
**සා. සෙබස්තියන් බාලිකා මහ විදුහල  - කඳාන**

# ඔබට ද සාන්තුවරයකු විය හැකිය

**ඔබ කුඩා දරුවෙක්, දැරියක් වුවද ඇත්තෙන්ම ඔබටත් සාන්තුවරයෙක් සාන්තුවරියක් වීමට අවස්ථාව තිබෙන බව සමහරවිට නොදන්නවා වන්නට පුළුවන.**

ඔබගේ ජීවිතය ගත කරන ආකාරයෙන්, හැසිරෙන ආකාරයෙන් ඒ සඳහා දෙවිඳුන් කරන ඇරයුම පිළිගැනීමට ඔබ සූදානම් ද?

මෙය කිතුනු දරු දැරියන්ට පමණක් නොව ලොව වෙසෙන අන්‍යාගමික දරු දැරියන්ට ද එකසේ විවෘත ආරාධනාවකි. උදාහරණයක් වශයෙන් ඔබට බුද්ධිමය වශයෙන්, ගැඹුරින්, තර්කානුකූලව සිතන්නට මෙන්ම අධ්‍යාපන කටයුතු වලට සමත්කම් දක්වන්නේ නම් එම කාර්යයන් අවංකව, උද්යෝගිමත්ව, ස්වෝත්සහයෙන් කරයි නම් ඒ තුළින් දෙවි පියාණන් ඔබව සමාජය තුළ බුද්ධිමතෙක් ලෙස, සම්පත් දායකයෙක් ලෙස ක්‍රියා කිරීමට ලැබෙන අවස්ථා තුළින්, සේවය නියමාකාරයෙන් හෘද සාක්ෂිය තුළින්, එන නිවැරදි හඬට අවනතව කටයුතු කොට, සාන්තුවර භාවයට ඔබ පත් වනු ඇත. එය ඔබව දේව තාත්තා කැඳවන ආකාරයයි. ඇල්බට් අයින්ස්ටයින්, ශ්‍රීමත් අයිසැක් නිව්ටන්, ග්‍රෙගර් මෙන්ඩල් වැනි විද්‍යාඥයන් එම කැඳවීම ලද අයයි. එපමණක් නොව සාහිත්‍ය, කලාව, දේශපාලනය, වාස්තු විද්‍යාව, නීතිය යනාදී විෂයයන් හා වෙනත් විෂයයන් වලින් ද උසස් මට්ටමකට පැමිණි බුද්ධිමතුන් හට එම සාන්තුවර භාවයට, මුනිවර භාවයට පත්වන්නට හැකිය.

ඔබට දේව භක්තිය කෙරෙහි වැඩි නැඹුරු බවක් තිබේ නම් එමඟින් ද සාන්තුවර බව ඔබ කෙරෙහි විවර වී ඇත. ශුද්ධවූ බයිබලය නිතර කියවීම, දිව්‍ය පූජා යාගයට සහභාගි වීම, සමඟි වීමේ ප්‍රසාද නිධානය (පාපොච්චාරණය) ලබා ගැනීම දෙවිඳුන් කෙරෙහි නිතර යැපීම යන ගුණාංග ඔබ වෙත පවතින්නේ නම් ස්ථිරයෙන්ම දෙවියන් වහන්සේ ඔබ කැඳවන්නේ දේව භක්තිය විහිදුවන සාන්තුවරයෙක් වීම කෙරෙහිය. ශුද්ධවූ අන්තෝනි මුනිතුමා, ශුද්ධවූ සෙබස්තියන් මුනිතුමා, ශුද්ධවූ ජුඩ් තද්දේවුස් මුනිතුමා ඒ අතරෙන් කීප දෙනෙකි.

ඔබ ඇතැම් විට දයාව දක්වන්නට, එකිනෙකාට සහය වන්නට, අසරණයන් ගැන සොයා බලන්නට මෙන්ම කරුණාව දක්වන්නට සුවිශේෂ ලැදියාවක් දක්වයි නම් මානව දයාව තුළින් දෙවිඳාණෝ ඔබ ශුද්ධවන්තභාවය කරා කැඳවති. භාග්‍යවත් තෙරේසා මව්තුමිය, ශුද්ධවූ නිකලස් මුනිතුමා, සා. වින්සන් ද පාවුලා මුනිතුමා එහිලා කීප දෙනෙකි. ඔවුන් තුළ නිරන්තරයෙන් මානව භක්තිය පැවතිණ. එමඟින් ද ඔබ ලබන ශුද්ධවන්ත භාවය අමිල සම්පතකි. ඒ සඳහා තවමත් ඔබ ප්‍රමාද නැත. දුර්පරීක්ෂා වලින් ජයගෙන නිවැරදි මාවතට ඔබ පිවිසෙන්නේ නම් ජේසු තුමා ඔබට අත්වැලක් ලබා දේ.

සේවය කිරීම සඳහා ආදර පුතේ, දුවේ ඔබට මුළු හදවතින් කැමැත්තක්, නැඹුරුතාවයක් පවතින්නේ නම් සත්‍ය වශයෙන්ම ඔබට සේවය මඟින් ලැබෙන වරප්‍රසාද සමුදාය සුවිශාල නිධානයකින් වැහෙන මිණිකැට, රන් රිදී වැන්න. භුදෙක් ලාභ ප්‍රයෝජන වලට වහල් නොවී දෙවි පියාණන් වහන්සේ වෙනුවෙන් සේවය කරන්නේ නම් එය දේව තාත්තාට ඉමහත් ආනන්දයකි. ඇතැම් දරු දැරියන් නිතර පාසල තුළ, පන්ති කාමරය තුළ, දහම් පාසල තුළ, නිවස තුළ සෙසු අයට ප්‍රථමයෙන් තමන්ට පැවරී තිබෙන වැඩ කොටස් නොපිරිහෙලා ඉටු කරන බව පෙනෙන්නට තිබේ. එපමණක් නොව, ඔව්හු අන්‍යයන් කිරීමට අකමැති, යොමු නොවන කටයුතු ඉටු කරන්නට ද ආශාවෙන් සිටිති.

එය දේව ප්‍රසන්නභාවය ඔවුන් වෙත ගලන මාවතකි. මෙලෙස සාන්තුවරයෙක්, සාන්තුවරියක් වන්නට කුඩා, කුඩා දේවල් තුළින් ඔබට හැකි බව තේරුම් ගෙන, සියලු අවස්ථාවලදී හෘද සාක්ෂියට සවන් දී ඊට නිසි ප්‍රතිචාර දක්වා, ඔබව යොමු කරන ක්ෂේත්‍රය කෙරෙහි අවදි වන්නට වෑයම් කළ යුතුය. ඔබ එලෙස නොකරයි නම් එය දේව වරප්‍රසාද ගිලිහී යන්නට තුඩු දේ. ඒ නිසා දැන් පටන් ඉහත දැක් වූ කරුණු පිළිබඳ අවධානය යොමු කොට සාන්තුවර මාවතකට පිවිසෙන්නට ආරාධනා කරමු.

**මලින්ත බෝපෙආරච්චි**
**දලුගම - කැලණිය**

# ජපමාලය



දුවේ පුතේ, පුංචි ඔයාලට දේව මාතාවන්ට ගෞරව කළ හැකි එකම මාර්ගය ජපමාලයයි. ජේසුගේ අම්මා ලෙස එතුමිය අප හැමෝගේම අම්මා. ඉතිං අපේ අතට ජපමාලට අරන් දවසේ එක මොහොතක් එය කියනවා නම් අපේ ඒ අම්මාට කොයිතරම් ආස හිතෙයිද? පුංචි ඔයා තනියම නෙමෙයි ඔයාලගේ ළඟ ඉන්න යාළුවෝත් එක්ක එකතු වෙලා ජපමාලය කියන්න. අපි හොඳ දේවල් කළාම , අනිත් අයගේ හොඳ අහන කොට ඔයාලට සතුටුයි නේද? ඒ වගේම තමයි අපි එකතු වෙලා අපි අම්මා වෙන්වෙන් ජපමාලය කියන කොට ඒ අම්මාට කොයිතරම් සතුටක් දැනේවිද?

ඒ වගේම තමයි දරුවෙක් විදිහට අපි ඉල්ලන ඕනෑම දෙයක් දෙවි සමිඳුන් හමුවේ මැදහත් වෙලා ඉටු කරලා දෙනවා තව තවත් අපි ජේසු ළඟට ළං කරනවා. අපව සුරලොවට යාමට තියෙන එක ඉනිමඟක් තමයි මේ ජපමාලය එක නිසා අපි හැමදාම එතුමිටය වෙනුවෙන් ජපමාලය කියන්න පුරුදු වෙමු.

**සිතාරා ශෂිකා නැන්ද**
**හෝමාගම**
**( පන්නිපිටිය මීසම)**

# දරුවන්ට කිව හැකි යාච්ඤා.....

## උදෑසන යාච්ඤාව

මා මවා ආරක්ෂා කරන්නා වූ ආදර දෙවි පියාණෙනි, මෙම උදෑසන මම ඔබ වහන්සේ වෙතට හැරෙමි. මම ඔබ වහන්සේට මා සතු සියල්ලම භාර කරමි. මගේ අද දවසේ සියළු වැඩ කටයුතු බලාපොරොත්තු උත්සාහයන්, සිතුම් පැතුම්,සියල්ල ඔබවහන්සේ වෙත තබමි. මට ආධාර කළ හැක්කේ ඔබ වහන්සේට පමණය. ස්වාමිනී සියළු අනතුරු වලින්ද, යක්ෂයාගෙන් හා නපුරු ආත්මයාණන්ගෙන්ද, වෙනත් ආකාර සියළු අහිතකර බලවේගයන්ගෙන්ද, මා ආරක්ෂා කළ මැනව.

ඊයේ දිනය තුළ ඔබවහන්සේ මට දානය කළාවූ සෑම දීමනාවක් සඳහා ම මම ඔබවහන්සේට ස්තූති කරමි. ඔබ මට දුන් ආරක්ෂාව එදිනෙද භෝජනය මගේ බලාපොරොත්තු උදෙසාද, මගේ කණගාටු හා මගේ අසාර්ථකත්වයන් උදෙසා ද මම ඔබ වහන්සේට ස්තූති කරමි. ප්‍රශංසා කරමි. ස්වාමිනී, ඔබවහන්සේ කෙරෙහි මම විශ්වාස කරමි. ඔබවහන්සේ මට ඉගැන්වූ සියළුම දේ කෙරෙහි විශ්වාස කරමි. ඔබවහන්සේ මගේ මැවුම්කාරයාණන් බවද විශ්වාස කරමි.

ස්වාමිනී, මම ඔබවහන්සේ කෙරෙහි බලාපොරොත්තු වෙමි. ඔබවහන්සේ මට අවශ්‍ය සියළුම යහපත් දේ දනය කරන බවත් මට උවමනා සියළුම වරප්‍රසාදයන් නොඅඩුව ලබාදෙන බවත් විශ්වාස කරමින් ඔබවහන්සේ කෙරෙහි බලාපොරොත්තුවෙමි. විශේෂයෙන් අද දවසේ මගේ සියළුම ප්‍රයත්නයන් හා බලාපොරොත්තු ඔබවහන්සේ වෙත තබමි. ස්වාමිනී, මම ඔබ වහන්සේට ආදරය කරමි. මගේ මුළු හෘදයෙන්ද, මුළු ශරීරයෙන්, මුළු ආත්මයෙන් සියල්ලටම වඩා මම ඔබවහන්සේට ආදරය කරමි. ඔබවහන්සේ දමිටුවන්ටද, අදමිටුවන්ටද, දුප්පතුන්ටද, පොහොසතුන්ටද, ඉරුඑළිය උදකරන සේක. වාර්ෂාව වස්සවන සේක. අප කොයි තරාතිරමක සිටියත්, ඔබවහන්සේ අපට ඔබගේ පීතෘක ප්‍රේමය පෙන්වන සේක.

එබැවින් ස්වාමිනී උදවුනා වූ අද දවස ඔබවහන්සේට ඔප්පු කරමින් ඔබවහන්සේගේ ආශිර්වාදය තුළ ඔබට ප්‍රසන්න ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය වරම් දනය කරන ලෙස අයැද සිටිමි. මෙකීදේ ඔබවහන්සේගේ පුත්‍රයාණන් හා අපගේ ස්වාමින් වූ ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ මගින් අපට ලැබේවා - ආමෙන්.

## දෙමව්පියන් වෙනුවෙන් දරුවකුගේ යාච්ඤාව

ආදර දෙවි පියාණෙනි මගේ මවුපියන් වෙනුවෙන් මම ඔබ වහන්සේට යාච්ඤාකරමි. ඔවුන් අතින් සිදුවී ඇති සියළු වරදවලට හා දුර්වලකම් වලට කමා කළ මැනව. ඔවුන්ගේ විවාහ ජීවිතය සාර්ථක කළ මැනව. ඔවුන් දෙදෙනා එකිනෙකා කෙරෙහි ද දරුවන් වන අප කෙරෙහි ද පූර්ණ අවබෝධයෙන් විශ්වාසයෙන් කටයුතු කිරීමට අවශ්‍ය වරම් ශුද්ධාත්මයාණන් මගින් දනය කළ මැනව. ජීවිත ගමනේ ඔවුන් වෙහෙසට පත්වනවිට ඔවුන් ශක්තිමත් කළ මැනව. ඔවුන් තනිවන්නට ඉඩ නුදුන මැනව.

දහඩිය හෙළමින් අප පෝෂණය කිරීමට වෙහෙසෙන මගේ පියාගේ රැකියාවට / ව්‍යාපාරයට ඔබවහන්සේගේ නොමඳ ආශිර්වාදය දනය කළ මැනව. ලේ කිරි කර පොවා අපව හද වඩා ගෙන නිවසේ කටයුතු වල වෙහෙසෙන මගේ මවට ද ඔබවහන්සේගේ නොමඳ ආශිර්වාදය දනය කළ මැනව. ආදර දෙවි පියාණෙනි, මගේ දෙමව්පියන්ගේ යුග දිවිය සැමට ආදර්ශමත් වන්නට සැලසුව මැනව.

සියළු විපත්ති, කරදර හා හිත් වේදනා වලින් ඔවුන් මුදවා ගත මැනව ඔබ වහන්සේ ඔවුන්ට භාරදී ඇති කැඳවීම අනුව තම යුතුකම් ඉටුකරමින් දිගුකලක් නිරෝගිව ජීවත්වීමට ද ශු. ජුසේ තුමා හා මරිය තුමිය ආදර්ශයට ගනිමින් යහපත් පවුල් ජීවිතයක් ගත කිරීමට ද අවශ්‍ය ධෛර්ය ශක්තිය ඔවුන්ට දනය කළ මැනව. මෙකීදේ ඔබවහන්සේගේ පුත්‍රයාණන් හා අපගේ ස්වාමින් වූ ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ මගින් අපට ලැබේවා - ආමෙන්.

## ඉගෙනීමට පිහිට ඉල්ලා යාච්ඤාව

ආදර දෙවි පියාණෙනි, මාගේ ඉගෙනීමේ කටයුතු සියල්ල ම මම ඔබවහන්සේට පූජා කර ඔප්පු කරමි. මාගේ ඉගෙනීමේ කටයුතු සඳහා ඔබවහන්සේගේ ශුද්ධාත්ම ආශිර්වාදය දනය කළ මැනව. මා ඉගෙන ගන්නා වූ දේ හොඳකාරව අවබෝධ කරගන්නටත්, මතක තබා ගන්නටත්, විභාගයේ දී නැවත මතකයට නඟා ගැනීමටත්, අවශ්‍ය ඥාන ශක්තිය දනය කළ මැනව. මා කැඳවනු ලබන මාර්ගයේ යාමට ඔබ වහන්සේගේ මඟ පෙන්වීම මා හට අවශ්‍යව ඇත. මා ඉගෙන ගන්නා වූ පාසල , ආයතන හා එහි මා සමග ඉගෙන ගන්නා වූ සැම දෙනා ආශිර්වාද කළ මැනව. මගේ ගුරුවර ගුරුවරියන් හා අනෙකුත් සැමදෙන ද ඔබවහන්සේගේ ආශිර්වාදයෙන් පුරවාලුව මැනව.

ආදර ජේසුනි ඔබ වහන්සේ එදා ඔබවහන්සේගේ ගෝලයින්ට සියළු ගුරුහරුකම් කියා දුන්නා සේ මට ද කළ යුතු දෑ කියා දුන මැනව. යහපත් ආදර්ශමත් ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය වරම් මා හට දනය කළ මැනව මරිය තුමියනි, ශු. ජුසේ තුමෙනි, මට නිසියාකාරව අධ්‍යාපන කටයුතු කරගෙන යාමට අවශ්‍ය ධෛර්ය හා ශක්තිය හැකියාව ඉල්ලා මා වෙනුවෙන් ඔබ පුතණුවන් ඉදිරියේ මධ්‍යස්ථ වුව මැනව. - ආමෙන්.

උපුටා ගැනීම
ඩබ්.ඩී මෙරිල් කොස්තා මහතාගේ (ස්වර්ගස්ථ වූ)
**"එදිනෙද ජීවිතයට මගේ යැදුම් " ග්‍රන්ථයෙනි.**

# ක්‍රිස්තියානි ඉතිහාසයේ අසිරිය 43

## දේශපාලන විප්ලවවලට මැදිවන ක්‍රිස්තියානිය

කම්කරු ප්‍රශ්නයට විසඳුමක් සෙවීම ආගම් භේදයක් නැතිව හැම කෙනෙක්ම කරට ගත යුතු වගකීමක් බව ලෝකයට පෙන්වා දීමට ඔහුට ඕනෑ විය. එය සඳහා ඔහු 1891 දී ''වෙහෙසෙන මිනිස්සු'' නමින් විශ්ව ලේඛනයක් පළ කළේය. ශාසනයට සීමා නොවූ මෙවැනි ප්‍රශ්නයකට කතෝලික පාප්තුමෙක් අතගැසූ පළමු අවස්ථාව මෙය විය හැක. ඔහුගේ එම විශ්ව ලේඛනය රාජ්‍යපාලකයින්ගේ සේම විවිධ සමාජ නායකයින්ගේද අවධානය මෙම දැවෙන ප්‍රශ්න කෙරෙහි යොමු කරන්නට සමත් විය. දරුණු විප්ලවයකින් රුසියාව විසඳීමට තැත් කළ කම්කරු ප්‍රශ්නය වඩා සාමකාමී විලාශයකට යුරෝපයට විසඳගන්නට ලැබුණා නම් ඒ 13 වෙනි ලෙයෝ වැනි කතෝලික නායකයන්ගේ දූරදර්ශී ක්‍රියාවලිය නිසායැයි කිව හැක.

**Iv. ප්‍රංශය**

19 වෙනි සියවසේ යුරෝපයේ මහා කැලඹීම්වලට මුල පිරුණේ ප්‍රංශ විප්ලවයෙන් යැයි ඉහත කියැවුනි. ප්‍රංශ විප්ලවය කතෝලික ශාසනය කෙරෙහි බලපෑවේ සුළු පටු විලාශයකට නොවේ. එහෙත් දේශපාලන විප්ලවවලින් හෙලවිය හැකි වූයේ ආයතනික ස්වරූපයේ ක්‍රිස්තියානිය පමණි. ජීවිත මාර්ගික ක්‍රමයේ ක්‍රිස්තියානියම නොවේ. ජීවිත මාර්ගික ක්‍රමයේ ක්‍රිස්තියානිය ආධ්‍යාත්මක ය. ප්‍රංශ විප්ලවයට වේවා වෙනත් කුමන දේශපලන විප්ලවයකට වේවා එම ක්‍රමයේ ක්‍රිස්තියානිය පෙරළිය නොහැක.

**ලිසියාවේ තෙරේසා (1873 - 1897)**

එයට නිදසුනක් වශයෙන් මෙම විප්ලවකාරී ශතවර්ෂය තුළ ප්‍රංශයේ කුඩා කන්‍යාරාමයක සිට ප්‍රංශය මත පමණක් නොව මුළු ලොව පුරාම ද විශාල බලපෑමක් කළ තරුණ පැවිදි වරියකගේ කථාව දැක්විය හැක. ඈ ලිසියාවේ තෙරේසා නමින් හැඳින්වෙන තැනැත්තිය ය. ඈ වයස 25 ක් වීමටත් පෙර ක්ෂය රෝගයෙන් මිය ගියාය. ඇගේ ජීවිතයේ ආදර්ශමත් භාවය දුටු ඇගේ නායිකාව ඈට තම ජීවිත කථාව ලියන සේ ඉල්ලා සිටියා ය. එම ජීවිත කථාව තුළ එක තැනක තමා ''කුඩා මලකට'' සමාන කර තිබීම නිසා ඇය ''කුඩා මල'' නමින්ද හැඳින්වේ.

මෙම පොතේ පණිවුඩය නිසාම එය ඉතා ඉක්මනින් දසදෙස පැතිරෙන්නට විය. එය ඉතාමත් උසස් මට්ටමක සාහිත්‍ය කෘතියක් සේ ගනු ලැබීමට පවා උචිත ය. එයින් ප්‍රකාශ වන පණිවුඩය ලක්ෂ සංඛ්‍යාත ජනකායකගේ චරිත වර්ධනයට හේතු වී ඇත. ඒ පණිවුඩය මෙයය : ශ්‍රේෂ්ඨ ජීවිතයකට හොඳම මඟ අසාමාන්‍ය දේවල් කිරීමට තැත්කිරීම නොව, සාමාන්‍ය දේවල් අසාමාන්‍ය ආත්ම පරිත්‍යාග යකින් කිරීමට තැත්කිරීම ය. ඇගේ ජීවිත ආදර්ශයෙන් ඈ පෙන්නුවේද එය ය.


ලිසියාවේ තෙරේසා

19 වෙනි ශත වර්ෂය සම්බන්ධයෙන් අවසාන වශයෙන් කිවයුත්තේ මෙය ය. එය දේශපාලනමය අතින් විප්ලවකාරී යුගයක් විය. එය ඉදිරියේ එන්නට තිබෙන වඩා විශාල විප්ලවවලට මගපාදන යුගයක් ද විය. එම විප්ලව නිසා ක්‍රිස්තියානියට ඇතැම්විට හානිවිය. එහෙත් ඒ ආයතනික ක්‍රමයේ ක්‍රිස්තියානියට මිස ජීවිත මාර්ගික ක්‍රමයේ ක්‍රිස්තියානියටම නොවේ. ඒ පැත්තෙන් ගත්විට ක්‍රිස්තියානිය තුළ මෙම යුගයේදී දියුණුවක්ද ඇතිවුවා යැයි කිව හැක.

එය වඩාත්ම හොඳින් පැහැදිලි වන්නේ ක්‍රිස්තියානි චර්යා රටාව හා ඊට අයත් වගකීම විග්‍රහ කිරීමට පළවූ පොත් දෙස බලන විට ය. නිව්මන්ගේ ඇපොලෝජියාවද, ඩොස්ටොයිස්කි හා ටෝල්ස්ටෝයිගේ නවකථාවද, 13 වෙනි ලෙයෝ පාප්තුමාගේ විශ්ව ලේඛනයද ඒ සමග ලිසියාවේ තෙරේසාගේ චරිත කතාවද එම කෘතීන් අතර වේ. ඒවා එම කාලය තුළ ක්‍රියාත්මක වූ ක්‍රිස්තියානියේ මට්ටම කියාපාන කැඩපතක් මෙන් වේ.

ඉදිරියට .......

**සංස්කාරක පියතුමන් විසිනි**



**දෙව්පියා මැව් ලස්සන ලෝකය**

**නිවර්තනා සෙව්මිණි**

06 ශ්‍රේණිය
ශා. මතෙව් ධර්මදූත ළමා සමාජය - ඒකල (කොටුගොඩ මීසම)



**අසිරිමත් මැවිල්ල**

**ටමේෂ රිහාන් වාහලතන්ත්‍රි**

03 ශ්‍රේණිය
ශු. ජෙරාඩ් මජේල්ලා දහම් පාසල සපුගහවත්ත කළුතර, (නාගොඩ මීසම)



**පරිසරයේ අසිරිය**

**දිනීෂ ඇන්ටන් ප්‍රනාන්දු**

03 ශ්‍රේණිය
ශා. රීටා දහම් පාසල - මාඑලිය (ජා-ඇල මීසම)



**මුහුදු වෙරළේ සරුංගල් යවන ළමයි**

**ස්වේන් දේදුනු ප්‍රශංසා**

03 ශ්‍රේණිය
නිමල මරිය බාලිකා ප්‍රාථමික විදුහල කුඩැල්ල



**පල්ලියේ කොඩිගස**

**සෙනාල් ප්‍රනාන්දු**

1 ශ්‍රේණිය
ශා. සෙබස්තියන් විදුහල - මොරටුව

## පුංචි අපේ චිත්‍ර පිටුව

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.
"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.



**දේව මෑණියෝ**

**සිත්මල් උදන සිල්වා**

04 ශ්‍රේණිය
ලොයොලා විදුහල - බෝපිටිය

# ශු. ජෙරෝම් මුනිතුමා



සුදුවර චරිතයක්

හඳුනාගනිමු



ජෙරෝම් තුමා (St. Jerome) ක්‍රි.ව. 342 දී අක්විලියාවේ උපත ලබා රෝමයේ දී මූලික අධ්‍යාපනය ලබා ගත්තේය. ඩැමේසස් පාප්තුමාගේ ලේකම්වරයා ලෙසද ටික කලක් කටයුතු කළ මෙතුමා ඩැමේසස් පාප්තුමාගේ (Pope Damasus) ඉල්ලීම පරිදි මෙතුමා ක්‍රි.ව. 386 දී ශුද්ධවූ බයිබලය ලතින් භාෂාවට ක්‍රමානුකූලව පරිවර්තනය කළේය (Systematic Latin Translation of the Bible). වල්ගේට් (Vulgate) නමින් හඳුන්වන මෙම පරිවර්තනය නිසා මෙතුමාට සභා පඬිවරයෙකු ලෙස කීර්ති නාමයක් ලබා ගැනීමට හැකිවිය. ඊට අමතරව බයිබලය හැදෑරීමට උපකාරී වන ග්‍රන්ථ කීපයක් ද මෙතුමා විසින් සම්පාදනය කළේය.

ද්විතීය සම්මත ග්‍රන්ථ හා ජුදෙව් ලියැවිලි අතර සම්බන්ධය ගැන තේරුම් ගැනීමට පළමුවෙන් හැකිවූයේ ජෙරෝම් තුමාටය. ශුද්ධවූ ලියැවිලි වශයෙන් පිළිගත යුතු පොත් පෙළ (Canonical Books) විනිශ්චය කිරීම සඳහා ක්‍රි.ව. 397 දී කාතේජ් මන්ත්‍රණ සභාවේදී ජෙරෝම් තුමාගේ මග පෙන්වීම හා දායකත්වය ඉතා ප්‍රයෝජනවත් විය. ජෙරෝම් තුමා ඔරිගන් තුමාගේ කෘතීන් (De Principiis) ලතින් භාෂාවට පරිවර්තනය කළ අතර එවැනි ආගමික ලේඛකයින් ගැන තොරතුරු ඇතුළත් ලියවිල්ලක් ද සම්පාදනය කළේය.

මෙලෙස ක්‍රි.ව. 392 දී පමණ එකල ජීවත්වූ සභා ශ්‍රේෂ්ඨයින්ගේ ජීවිත කතා ඇතුලත් විශිෂ්ට පුද්ගලයින්ගේ ජීවන චරිත" නමැති ග්‍රන්ථය (De Viris Illustribus or Lives of Illustrious Men) ඔහු විසින් සභා ඉතිහාසයට දෙන ලද දායාදයක් සේ සැළකේ. පේදුරු තුමන්ගෙන් පටන් ගෙන තමා දක්වා වූ සභාවේ නායකයින් රැසකගේ ජීවන චරිත 135 ක් මෙම ග්‍රන්ථයේ අඩංගුවී ඇත. පසු කලක සාන්තුවරයන්ගේ චරිත කථා ලිවීමට මෙතුමාගේ මෙම කෘතිය පූර්වාදර්ශයක්වී ඇත (Vita Pauli Monachi). දුර්මතධාරීන්ට විරුද්ධව ඉතා වේගවත් භාෂා ශෛලියකින් ලිපි ලේඛන රචනා කළේය. ඒ අතර හෙල්විඩියස්ට, ජොවිනියන්ට හා පෙලාජියන්වාදීන්ට විරුද්ධව ලියූ ලේඛන මූලික තැනක් ගනී.

මෙතුමා ශුද්ධවූ ලියවිල්ල කියවීමෙන් හා එය භාවනා කිරීමෙන් තමා ලැබූ අත්දැකීම් පාදක කොට ගෙන විවිධ ලිපි ලේඛන ලියමින් තම තාපස ජීවිතය ගත කළ බව ඉතිහාසයේ සඳහන්වේ. එහි ප්‍රතිඵලයක් ලෙස එතුමා විසින් සම්පාදනය කරන ලද මෙම බයිබලිය විවරණ ග්‍රන්ථය වත්මනේ ද බයිබලය පිළිබඳව අධ්‍යයනය කරන්නන් හට මහත් රුකුළකි. විශිෂ්ට බයිබල් විශාරදයකු ලෙස වත්මන් සභාවේ ද ඔහු ප්‍රකටය.

එසේම මිත්‍යා මතධාරීන්ට විරුද්ධව ඉතා වේගවත් භාෂා ශෛලියකින් ලිපි රචනා කළේය (Adversus Helvidium & Contra Jovinianum & Dialogus Adversus Pelagianos). මෙතුමා ශුද්ධවූ ලියවිල්ල කියවීමෙන් හා එය භාවනා කිරීමෙන් තමා ලැබූ අත්දැකීම් පාදක කොට ගෙන විවිධ ලිපි ලේඛන ලියමින් තම තාපස ජීවිතය ගත කළ බව ඉතිහාසයේ සඳහන්වේ (Jerome Biblical Commentary). තම ජීවිතයේ අවසාන කාලයේ දී ශුද්ධවූ දේශයේ තපස් ජීවිතයක් ගතකළ අතර එම කාල වකවානුවේ දී කන්‍යාරාම තුනක් හා තාපසාරාමයක් ද තනවන ලදි.

තාපසයකු ලෙස ශුද්ධවූ දේශයේ තාපසාරාමයක ඉතා දුෂ්කර තපස් ජීවිතයක් ගත කළ ජෙරෝම් තුමා ක්‍රි.ව. 420 දී එහිම මිය ගියේය. මෙතුමා ක්‍රි.ව. 385 දී බෙත්ලෙහෙමට ගොස් සිය ජීවිතයේ ඉතිරි කාලයෙ තාපසයකු ලෙස ජීවත් විය. ක්‍රි.ව. 420, සැප්තැම්බර් මස 30 වන දින එම තාපසාරාමයේදීම ස්වර්ගස්ථ විය. ශ්‍රෙෂ්ඨ බයිබල් විශාරදයකු ලෙස හා දේවධර්මවේදියකු ලෙස අද දක්වාම කිතුනු බැතිමතුන්ගේ ගෞරවාදරයට ශුද්ධවූ ජෙරම් මුනිතුමා පාත්‍රව ඇත

**අසේල දසනායක**

# ප්‍රහේලිකා අංක 43



### හරහට

1. ක්‍රිස්තුන් වහන්සේගේ ගෝලයන් මෙය නොකරන්නේ මන්දැයි ස්නාවක ජුවාම් තුමාගේ ගෝලයෝ ක්‍රිස්තුන් වහන්සේගෙන් ප්‍රශ්න කළෝය.

4. ''.................... කරන්න, ඔබට දොර අරිනු ලැබේ''. ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. හිස්තැනට සුදුසු වචනය

5. ''............. සත්‍යයද, ජීවනයද, මම වෙමි'' ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

7. ක්‍රිස්තුන් වහන්සේ වදාළේ මේවායින් ගස හඳුනාගත් හැකි බවයි.

8. නීති විරෝධිවූ උග්‍රැමස් අනුභව නොකිරීම නිසා මවක් හා දරුවන් සත් දෙනෙකු මර ණයට පත් වූ අයුරු ශුද්ධවූ බයිබලයේ මෙම පොතේ විස්තර වේ.

10. දෙවියන් වහන්සේ තම ස්වරූපය අනුව මිනිසා මවා වදාළ සේක. මෙය..... වන දවසය. මෙහි හිස්තැනට සුදුසු වචනය

### පහළට

1. අසා සිටි සැම දෙනාටම තේරුම් ගත හැකි ලෙස තම ඉගැන්වීම් ඇතැම් විට මේවා මාර්ගයෙන් ක්‍රිස්තුන් වහන්සේ ඉගැන්වූ සේක.

2. ''ඔබේ විරුද්ධකාරයා සමග උසාවියට යන කළ මඟදීම ඉක්මනින් ඔහු හා සමගි වන්න. නැත්තම් ඔබ නඩුකාරයාට බාර දෙන්නේය අන්තිම ..........ට දඬය ගෙවනතෙක් ඔබ කිසිසේත් පිටවී නොයන්නේය'' යනුවෙන් ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

3. මෙම දොරටුවෙන් ඇතුල්වන්න විරියය කරන්නැයි ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක.

6. දෙවියන් වහන්සේට මෙය දක්වන්නන්ගේ ජීවිතය පිළිබඳව උපදේශකයා , හෙවත් සිරාක් විස්තර කරයි.

7. ක්‍රිස්තුන් වහන්සේ කුරුසියේ ඇණ ගැසීමට පෙර හේවායෝ මෙම වදන් වලින් උන්වහන්සේට නිගා කළ බව කියැවේ.

9. ක්‍රිස්තුන් වහන්සේව මරණයට පත් කිරීමට පෙර උන් වහන්සේට මේවායින් තැලු බව කියැවේ.

**(මෙම ප්‍රහේළිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපයෝගී කර ගත හැකිය. ශු. මාක් 5,7,9 ශු. ලූක් 6, උපදේශකයා හෙවත් සිරාක් 32/14, උත්පත්ති 1 )**

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා** - කිරිමැටියාගාර

# නොනිම් සෙනෙහස

සුන්දර ආදරේ අරුත සොයාගෙන
ජේසුනි මං ගිය දුර බෝමා
නෑ හමු වුයේ බොල් මිස හරයක්
දෙව්දුගේ ආදරේ වගෙ තවම

සදා කාලිකයි කියූ ආදරේ
නටඹුන්වත් නැත ඉතිරි වෙලා
සුන්දර පිවිතුරු කියූ ආදරේ
කඳුල පමණි මට ඉතිරි කළේ

හදවත දැවී දැවී මා මිය යද්දී
කිතු තුම ඔබ මා සිප ගත්තේ
ජේසුගේ ආදරේ හිමාලයක් මෙන්
නොසැලි තවමත් ලඟ රැඳුනේ.........



**ඇන්ජලා ශ්‍රීමාලි - (දහම් ගුරු )**
**සාන්ත මරියා දහම් පාසල - වැල්ලවාය**

### ප්‍රහේළිකාව පුරවා එවීමේදී

- ප්‍රහේළිකා පුරවා එවීමේදී ඔබගේ නම, ලිපිනය, පාසල, දහම් පාසල, ඉගෙනුම ලබන ශ්‍රේණිය හා දුරකතන අංකයද පැහැදිලිව ලියා අප වෙත යොමු කරන්න.
- එක් අයෙකුට ප්‍රහේළිකා පුරවා එවිය හැක්කේ 2 ක් පමණක් බැව් කරුණාවෙන් සලකන්න.
- ඔබ පුරවා එවන ප්‍රහේළිකාව තැපැල් පතක අලවා එවීමද **අනිවාර්ය** බැව් සලකන්න.

**සංස්කාරක පියතුමා**


ශුද්ධ වූ බයිබලය
ඇසුරෙනි
මෝසෙස්
40
චිත්‍ර කථා රචනය ආනන්ද කල්දේරා
දෙබස් හා චිත්‍ර පාලිත සඳු ආරච්චි
මෝසෙස් එහා හෙබ්‍රෙව්වරුන් කැඳෙව්වා
සගයිනි මා කියන දේ හොඳින් අසා ගනිල්ලා
පාරාවෝ අපව වහල් බවෙන් නිදහස් කරන්නේ නැතිනම්.. දෙවියන් වහන්සේ මට මෙසේ පවසා තිබෙනවා..
අද රාත්‍රී මරණයේ දේවදූතයා මේ ඊජිප්තු දේශය හරහා යනවා... එවිට ඊජිප්තුවරුන්ගේ සෑම පවුලකම මුලින්ම උපන් දරුවා මරණයට පත්වෙනවා
අහෝ.. සෑම පවුලකම පළමු දරුවා ?
ඔව්.. අප දෙවියන් වහන්සේගේ අණට කීකරු වනවා නම් අපට ගැලවෙන්න පුළුවන්
ඊජිප්තුවරුන්ගේ කුළුදුල් දරුවන් මියයන බව මෝසෙස් ඊශ්‍රායෙල්වරුන්ට පැවසුවා.. ඉන්පසු ඊශ්‍රායෙල්වරුන්ට එයින් ආරක්ෂා වන සැටි විස්තර කර දුන්නා
සෑම ඊශ්‍රායෙල් නිවසකම උළුවස්සේ අද බැටළු ලේ තවරල තියන්න
තාත්තා..
ඇයි මේ ගෙවල්වල උළුවස්සෙ බැටළු ලේ ගාන්නෙ..
සෑම ඊශ්‍රායෙල් ගෙදරකම උළුවස්සෙ ලේ තවරන්න කියල.. දෙවියන් වහන්සේ මෝසෙස්ට කියා තිබෙනවා..
පාරාවෝ අපිට යන්න දෙනව කියල කී වතාවක් බොරු කළාද
එවිට.. මේ ලේ තැවරූ ගෙවල් මග හැර යන්න මරණයේ දේවදූතයාට හැකිවෙයි..
මේ සැරෙනම් අපිට වහල් බවෙන් මිදෙන්න හැකි වෙන බව ස්ථිරයි

නායකයින්ගෙද සෙයාරූ ස
අපේ දහම්



ළමා ප්‍රදීපය











## නිවාසාන්තර ක්‍රීඩා තරඟ

මේ පාසල් වල නිවාසාන්තර ක්‍රීඩා තරඟ සිදු කරන කාලයයි. විශේෂයෙන්ම ජය පරාජය හමුවේ ජීවිතය ජයගන්නට ක්‍රියාවෙන්ම පෙන්නුම් කරන මේ නිවාසාන්තර පාසල් ක්‍රීඩා තරඟ නිසා විනය, ගුණගරුක බව, කීකරුකම, නිහතමානීකම හා ආගම දහමට ලැදි දරුවන් පිරිසක් බිහිවන බව අපේ කතෝලික පාසල් වල මූලික විශ්වාසයයි.

**ඡායාරූප : අෂේන් එස්. සේනාරත්න**
**ඩියෝන් සේනාධීර**



